මාධ්‍ය ඒකකය
ஊடகப் பிரிவு
MEDIA UNIT
නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය
நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சு
MINISTRY OF URBAN DEVELOPMENT & HOUSING
18 මහල,"සුහුරුපාය",බත්තරමුල්ල
මාධ්‍ය ලේකම් - +9477 9633 516 E mail - pradeepkumara49@yahoo.com

2024.06.18

# ප්‍රවෘත්ති නිවේදනය

ලොව පුරා තෙත් බිම් පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙලක් සැකසීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. මේ දිනවල බත්තරමුල්ල වෝටර්ස් එඩ්ජ් හෝටලයේදී පැවැත්වෙන අන්තර්ජාතික තෙත්බිම් උද්‍යාන සමුළුවේදී ඊට සහභාගි වී සිටින රටවල් 15ක තෙත්බිම් උද්‍යාන නියෝජිතයෝ මේ බව දැඩි ලෙස පෙන්වා දුන්හ.

සමුළුවේ දෙවන දිනය අදයි.අද උදෑසන සමුළුවේදී අදහස් දැක්වූ තෙත් බිම් උද්‍යාන නියෝජිතයෝ ලොව පුරා තෙත් බිම් ආරක්ෂා කිරීමේ වැදගත්කම අවධාරණය කලහ.පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා තෙත්බිම් සංචාර යොදාගැනීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

මෙම සමුළුවට සහභාගී වූ පරිසරවේදීහු ඊයේ රාත්‍රියේ බත්තරමුල්ල දියසරු උද්‍යානයේ ගැවසෙන සතුන් නිරීක්ෂණය සඳහා ගියහ. දිසරු උද්‍යානය ජෛව විවිධත්ව අධ්‍යන උද්‍යානයක් ලෙස නිර්මාණය වූයේ 2014 වසරේ දී යි. සංක්‍රමණික පක්ෂීන් පනහක් පමණ වෙසෙන මෙහි තෙත්බිම් පක්ෂී විශේෂ අනූවකට අධික සංඛ්‍යාවක් සිටිති. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති නාගරික දිවියන් 05 දෙනෙකු ද ආවේණික මත්ස්‍ය විශේෂ 15 ක් සමනල විශේෂ 40 ක් ද මෙහි සිටිති.

තෙත්බිම් සමුළුවට පැමිණ සිටින විදේශීය තෙත්බිම් උද්‍යාන නියෝජිතයෝ අද උදෑසන මෙම උද්‍යානයේ කුරුල්ලන් නිරීක්ෂණයට ද එක් වූහ. මෙහිදී අදහස් දැක්වූ විදේශ පරිසරවේදීහු කීපදෙනෙකු ම පරිසර පද්ධතීන් ආරක්ෂා කරගනිමින් තෙත්බිම් සංචාරක ව්‍යාපාරය සඳහා යොදාගැනීමට ශ්‍රී ලංකාව දරන උත්සාහයට සිය ප්‍රසාදය පළ කළහ.

Braja Sundar Mishra
Action for protection of wild animals – India

“ශ්‍රී ලංකාවට පැමිණීම මගේ හීනයක් හැබෑ වීමක්. ලංකාවට ආවේ පළමු වතාවට. දියසරු උයනට පැමිණි අතර ඉතා සුවිශේෂී තෙත්බිම් කලාපයක්. තෙත් බිම් ආරක්ෂා කිරීමට රජය දක්වන උනන්දුව ගැන මා සතුටට පත්වෙනවා.
ඉන්දියාවේ තෙත්බිම් වල මා දැකපු කුරුලු විශේෂයන්ට වඩා විශේෂිත කුරුල්ලන් රැසක් මම මෙහිදී දැක්කා. ආසියානු හා ඔස්ට්‍රේලියානු රටවලින් පැමිණි නියෝජිතයන්ට ද මෙය සුවිශේෂී අවස්ථාවක්. අප වෙත දක්වන ආගන්තුක සත්කාරයත් අතිවිශිෂ්ඨයි”

Bulgan Odmaa
Chukh Bird Research Station
Mongolian Bird Conservation centre
Mongolia
“මම ඉතාම සතුටු වෙනවා ශ්‍රී ලංකාවට ආපු එක ගැන. මේ අවස්ථාව දුන්නට WLI එකමුතුවට ස්තූතියි. තෙත්බිම් සම්බන්ධයෙන් මගේ දැනීම හා අත්දැකීම් වැඩිකරගන්න හැකි උනා. තෙත්බිම් පිළිබද සංකල්පය ඉතා හොදින් කොළඹ නගරය තුළත් ශ්‍රී ලංකාව තුළත් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබද ව සතුටට පත්වෙනවා”

Madushmit Pati
Secretary
India Natures Club
“ශ්‍රී ලංකාව ඉන්දියානු අර්ධද්වීපය තුළ පිහිටි කුඩා රටක් වුව ද ඉතාම මනස්කාන්ත හා විසිතුරු රටක්. දේශගුණික තත්ත්වය ඉතාමත් සුවිශේෂීයි. නෙතට රසදුනක් බදු දර්ශනීය හා දැකුම්කළු වනපෙත් උයන්වලින් සමන්විත ශ්‍රී ලංකාව සංචාරක තෝතැන්නක්.”

ප්‍රදීප් අනුර කුමාර
(ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්)
077 9633516